# දිනමිණ 115 සැමරුම නිමිත්තෙනි

## 1909-2024 දක්වා දිනමිණ කතුවරු


එච්. එස්. පෙරේරා


ඩී. ඩබ්. වික්‍රමාරච්චි


ඇලෙක්සැන්ඩර් වැලිවිට



පියසේන නිශ්ශංක


මාර්ටින් වික්‍රමසිංහ



ඇම්.ඒ. ද සිල්වා


ඩී.ඩී. වෙත්තසිංහ


එස්. සුබසිංහ


ටී.බී. පෙරමුණේතිලක


එඩ්මන්ඩ් රණසිංහ


බන්දුල මෙත්තානන්ද


ජී.එස්. පෙරේරා


සරත් කුරේ



දෙල්තොට චන්ද්‍රපාල


බෙනට් රූපසිංහ


තිස්ස එදිරිසිංහ


සමන් වගආරච්චි


බන්දුපාල ගුරුගේ


කරුණාරත්න අමරතුංග


සී. දොඩාවත්ත


රන්ජන් අමරරත්න


මහින්ද අබේසුන්දර


ගාමිණී ජයලත්


පුෂ්පා රොවෙල්


සී.ජේ. අමරතුංග


මනෝජ් අබයදීර


ප්‍රදීප් දසනායක

වර්තමානයේ ප්‍රකාශයට පත් කරන පුවත්පත් අතරින් ආදීතම පුවත්පත දිනමිණයි. මෙහි ආරම්භක කරුවරයා වන්නේ එච්. එස් පෙරේරා මහතාය. අද වන විට දින මිණ පුවත්පත පළ කොට වසර 115කි. මේ කාල පරාසය තුළ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම හෙවත් ලේක්හවුස් ආයතනය යුග හතරක් ඔස්සේ විකාශනය විය.

1. එච්. එස් පෙරේරා යුගය.
2. ඩී. ආර් විජයවර්ධන යුගය.
3. ලේක්හවුස් යුගය.
4. රාජ්‍ය පාලන යුගය වශයෙනි.

එසේ හෙයින් එදා මෙදා තුර, දිනමිණ මුල් පුටුව හෙබ වූ කතුවරු ගණන 27 දෙනෙකි. දිනමිණ වෙනුවෙන් අසහාය මෙහෙයක් ඉටු කළ ඔවුන්ට මෙසේ උපහාර දක්වමු.

# දිනමිණ හැඩ වෙන්නේ මෙහෙමයි

'දිනමිණ' යනු සූර්යයාට කියන තවත් නමකි. දෛනික කාර්යයක් ලෙසින් නැගෙනහිරින් නැඟී එන හිරු ලොවම අවදි කර, ලොවම එළිය කර දවස නිමවෙද්දී බටහිරින් බැස යයි. 'දිනමිණ' පුවත්පත ද එසේය. නන් දෙසින් ගලා එන ප්‍රවෘත්ති හා ඡායාරූප පුවත්පතට උචිත ආකාරයට සකසා නන් දෙස පැතිර සිටින ජනතාවට තොරතුරු සන්නිවේදන කාර්යය ඉටුකර දවසේ සිය කාර්යභාරය නිමා කරයි. 1909 දෙසැම්බර් 17දා සිට අද දක්වාම දිනමිණ පුවත්පත දෛනිකව හිරු මෙන් ලොව අවදි කිරීමටත්, ඉන් ආලෝකයක් හෙවත් තොරතුරු සන්නිවේදන කාර්යයක් ඉටු කරන්නේය.

කොළඹ පිහිටි අලංකෘත ලේක්හවුස් මන්දිරයෙන් දිනපතා එළිදකින 'දිනමිණ' පුවත්පත හැඩ කරන අංශ කිහිපයකි. ප්‍රවෘත්ති අංශය, උප කර්තෘ අංශය, ප්‍රාදේශීය ප්‍රවෘත්ති අංශය, විශේෂාංග අංශය, ක්‍රීඩා අංශය, පරිගණක අංශය, සෝදුපත් අංශය, ඡායාරූප අංශය, ඡායාරූප සැලසුම් අංශය, පුස්තකාලය, වෙළෙඳ දැන්වීම් අංශය සහ පිටු සැලසුම් අංශය යනාදී අංශ රැසක එකතුවකින් දිනමිණ පුවත්පත නිර්මාණය වෙයි.

දිනපතා නිකුත්වන 'දිනමිණ' පිටු 24ක පුවත්පතකි. සාමාන්‍යයෙන් පුවත්පතක් මුද්‍රණවාර කිහිපයකින් නිකුත් වෙයි. ප්‍රාදේශීය හා කොළඹ වශයෙනි. පුවත්පතේ ඉහළ තරු ලකුණු සඳහන්ය. එය තරු එක නම් කොළඹ හා තදාසන්න ප්‍රදේශවලට යැවෙන මුද්‍රණයි. තරු දෙක නම් ප්‍රධාන නගරයෙන් මඳක් දුරට වන්නට ද, වන මුද්‍රණය වශයෙන් ද මුද්‍රණය කෙරේ.

පාඨක ඔබ අතට පත්වන වත්මන් දිනමිණ පුවත්පතෙහි වත්මන් ප්‍රධාන කතුවරයා වන්නේ ප්‍රදීප් දසනායක මහතාය. කර්තෘ මණ්ඩලය පුවත්පතේ අතිශයින්ම වැදගත් අංශයකි. කර්තෘ මණ්ඩලය මෙහෙයවීම පුවත්පතේ අන්තර්ගතය තීරණය කිරීම, පුවත්පතේ මුහුණුවර - බාහිර පෙනුම සැලසුම් කිරීම ආදී වශයෙන් වන අසීමිත වගකීම් හා අසීමිත කාර්යභාරයක් ප්‍රධාන කතුවරයා සතුය. ප්‍රවෘත්ති කර්තෘ, ප්‍රවෘත්ති සම කර්තෘවරුන්, ප්‍රාදේශීය කර්තෘ, විශේෂාංග අංශයේ කර්තෘවරුන්, රාත්‍රී කර්තෘ, රාත්‍රී සම කර්තෘ, නියෝජ්‍ය ප්‍රවෘත්ති කර්තෘ, ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදීන් ඇතුළු මාධ්‍යවේදීන්ගෙන් කර්තෘ මණ්ඩල කටයුතු සිදු කෙරේ. එසේම, කාලීන ප්‍රවෘත්ති, උසාවි වාර්තා, පාර්ලිමේන්තු වාර්තා, ආරක්ෂක වාර්තා, අධ්‍යාපන, සෞඛ්‍ය, සංස්කෘතික, ව්‍යාපාර යනාදි විෂයයන් යටතේ මාධ්‍යවේදීන් විසින් ප්‍රවෘත්ති ලබා දෙයි. ඒවා ඉහත කී ප්‍රධාන කතුවරුන්ගේ අධීක්ෂණය යටතට පත් වෙයි.

ඉන්පසුව එම ප්‍රවෘත්තිය උප කර්තෘ අංශයට ලබා දෙයි. පුවත්පතට ඉතාමත් වැදගත් මෙහෙයක් මේ අංශයෙන් සිදු වෙයි. සෑම දෙසින්ම ලැබෙන විවිධාකාරයේ ප්‍රවෘත්ති සදොස් තැන් නිදොස් කොට ශීර්ෂ පාඨ යොදා, අදාළ ඡායාරූප තෝරා බේරාගෙන සකසන්නේ මේ අංශයයි. වර්තමානයේ නවීන තාක්ෂණය යටතේ සියලු ප්‍රවෘත්ති පරිගණකය මඟින් සංස්කරණය කර අදාළ පිටුව වෙත යොමු කරයි.

ප්‍රාදේශීය ප්‍රවෘත්ති අංශයේ කාර්යභාරය වන්නේ, ප්‍රාදේශීය වශයෙන් සිදුවන සිද්ධි ද, අවස්ථා ද, පුවත්පත මඟින් ඉදිරිපත් කිරීමයි. එබැවින් ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගෙන් පුවත්පතට ලැබෙන ප්‍රවෘත්ති හා විශේෂාංග ගඟකට උල්පතක් මෙනි. දිනමිණට ලැබෙන ප්‍රාදේශීය පුවත්, ලිපි, ඊට උචිත ආකාරයෙන් වෙන්කර, වෙනමම ප්‍රාදේශීය පිටු සැකසීම සිදු කෙරෙන්නේ මේ ප්‍රාදේශීය ප්‍රවෘත්ති අංශයෙනි. මේ අංශය රට පුරා විසිරී පැතිරී සිටින ප්‍රාදේශීය මාධ්‍යවේදීන් හා මනා සබඳතාවක් ගොඩනඟාගෙන තිබේ.

ක්‍රීඩා පිටුවට ද හිමින්නේ විශේෂත්වයකි. දෙස් විදෙස් කෙළිබිමේ තොරතුරුවලින් මේ පිටුව හැඩ ගැන්වේ. ක්‍රීඩා කර්තෘ හා නියෝජ්‍ය ක්‍රීඩා කර්තෘ ඇතුළු ක්‍රීඩා අංශය මෙහි කටයුතු සිදු කරයි.

දිනමිණට විශේෂාංග ලිපි සැකසීම සිදුවන්නේ විශේෂාංග අංශයෙනි. මෙය, විශේෂාංග කර්තෘ හා නියෝජ්‍ය විශේෂාංග කර්තෘවරුන් ඇතුළු මාධ්‍යවේදීන්ගෙන් සමන්විතය. දේශපාලන, ආර්ථික, සමාජයීය, ආගමික, කලා, පොත්පත් ආදී අංශවලට අදාළ හරවත් විශේෂාංග ලිපි සැකසෙන්නේ මේ අංශයෙනි. විශේෂයෙන් කාලීන වශයෙන් වැදගත් ලිපි සම්පාදනය කිරීම ද විශේෂාංග අංශයෙන් සිදු කෙරේ. කතුවැකිය පුවත්පතේ හදවතය. එය ලියන්නේ දිනමිණ ප්‍රධාන කර්තෘවරයාය. පුවත්පතේ සහ ආයතන මතය, දැක්ම එයින් කියාපායි. එසේම, චිත්‍ර ශිල්පීන් හා කාටූන් ශිල්පීන් ද පුවත්පතකට මහඟු මෙහෙයක් ඉටුකරන පුද්ගලයෝ වෙති. ඔවුන් ද දිනමිණ හැඩ කරන්නට එක්වෙති.

කර්තෘ මණ්ඩලයට අයත් සියලු අංශවලින් ලැබෙන ලිපි පරිගණක අක්ෂරකරණය කරන්නේ දිනමිණ පරිගණක අංශයෙනි. ඔවුන්ගේ අක්ෂරකරණයෙන් පසු එම ලිපි සදොස් තැන් නිවැරැදි කරන්නේ සෝදුපත් අංශයෙනි.

දිනමිණ ලිපිකරු අංශයෙන් කෙරෙන්නේ ද අමිල සේවාවකි. කාර්යාල කාර්ය සහායක මහතුන්ගේ සේවාව ද මිල කළ නොහැකිය.

ලේක්හවුස් ඡායාරූප අංශයේ ඡායාරූප ශිල්පීන් ද මෙහි විවිධ අවස්ථාවල ඡායාරූප ගැනීමට නොපැකිළිව තම දායකත්වය සපයයි. ලේක්හවුස් පුස්තකාලය සතු ගබඩා කොට ඇති දත්ත හා ඡායාරූප පුවත්පතට ආලෝකයකි. සෑම අංශයකටම අදාළ ඉතා වැදගත් තොරතුරු සහ ඡායාරූප ලේක්හවුස් පුස්තකාලය සතු වෙයි. එබැවින් ආයතනයේ හදවත පුස්තකාලය යැයි පැවසුවහොත් සාවද්‍ය නොවේ.

ඡායාරූප ශිල්පීන් විසින් රැගත් ඡායාරූප සංස්කරණය කරමින් පුවත්පතට අවශ්‍ය ආකාරයට සකසා දෙනු ලබන්නේ ඡායාරූප සැකසුම් අංශයෙනි. ඡායාරූපයේ තත්ත්වය, වර්ණය, හැඩය හා ප්‍රමාණය පුවත්පතට අවශ්‍ය ප්‍රමාණයට හා සරිලන අයුරින් සකසා දීමට තරම් ඔවුහු හසළ දැනුමැත්තෝ වෙති.

පුවත්පතට දැන්වීම් ලබා ගන්නේ දැන්වීම් අංශයෙනි. පුවත්පතේ මූල්‍ය ස්ථාවරත්වය සකසා දෙන්නේ මේ අංශයෙනි.

දිනපතා ලබාදෙන ඩමියකට අනුව දිනමිණ පිටු සැකසීම සිදු කෙරෙන්නේ පිටු සැකසුම් අංශයෙනි. සියලු තොරතුරු, දත්ත හා ඡායාරූප එක්තැන් කර, අංශවලට අදාළ ඒ ඒ පිටු නිර්මාණාත්මකව හැඩ වැඩ කරමින් දිනමිණ පුවත්පතේ පූර්ව නිෂ්පාදන කටයුතු සම්පූර්ණ කරන්නේ මේ අංශයෙනි. අවසන් නිරීක්ෂණය පුවත්පතේ ප්‍රධාන කර්තෘ විසින් සිදු කරයි.

මේ ආකාරයට ඔබ අතට පත්වන පුවත්පත නිර්මාණය කිරීම දීර්ඝ ක්‍රියාවලියක් යටතේ විශාල පිරිසකගේ දායකත්වයෙන් සිදුවන්නකි. සාමූහික වෑයමක ප්‍රතිඵලයක් වූ දිනමිණ වසර 115ක් පුරා දිනපතා, අඛණ්ඩව මේ ක්‍රියාවලිය සිදු කර ඇත. එසේම ඉදිරියටත් එය නොයෙක් වෙනස්කම්වලට ලක් වෙමින්, නවීකරණය වෙමින් දිනමිණ තව බොහෝ කලක් විරාජමාන වනු ඇත.

**ශ්‍යාමා සමරසිංහ**
**ඡායාරූප - සුලෝචන ගමගේ**


දිනමිණ ප්‍රවෘත්ති අංශය


දිනමිණ උප කර්තෘ අංශය


දිනමිණ විශේෂාංග අංශය


දිනමිණ පිටු සැකසුම් අංශය


දිනමිණ පරිගණක අංශය


දිනමිණ සෝදුපත් අංශය

2024 දෙසැම්බර් 17 අඟහරුවාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.